# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1982 අංක 2 දරන
# ගුවන් සංතරණ (විශේෂ විධිවිධාන)
# පනත

---

[සහතිකය සටහන් කළේ 1982 ජනවාරි මස 20 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1982 ජනවාරි මස 22 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ : ශත 65 යි. තැපැල් ගාස්තුව : ශත 50 යි.

# 1982 අංක 2 දරන ගුවන් සංතරණ (විශේෂ විධිවිධාන) පනත

[සහතිකය සටහන් කළේ 1982 ජනවාරි මස 20 වන දින]

එල්. ඩී.—ඕ. 43/81

**ගුවන් සංතරණ පනත සංශෝධනය කිරීම සඳහා ද 1979 අංක 46 දරන ගුවන් තොටුපළවල් පිළිබඳ අධිකාරිය පනත ඉවත් කිරීම සඳහා ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** (1) මේ පනත 1982 අංක 2 දරන ගුවන් සංතරණ (විශේෂ විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — *ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය.*

(2) (අ) මේ වගන්තියේ සහ මේ පනතේ I වන කොටසේ විධිවිධාන මේ පනත පනවනු ලබන දිනයේ දී ක්‍රියාත්මක විය යුතු ය.

(ආ) මේ පනතේ II වන කොටසේ විධිවිධාන, (මෙහි මින් මතු මේ පනතේ එම කොටසේ "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයකින් නියම කරනු ලබන දිනයේ දී ක්‍රියාත්මක විය යුතු ය.

## I වන කොටස

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ගුවන් සංතරණ පනතේ 20 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයෙහි "අවශ්‍ය විය හැකි වෙනත් නිලධර යන් සහ සේවකයන්" යන වචන වෙනුවට "අවශ්‍ය විය හැකි වෙනත් නිලධරයන්, සේවකයන් සහ අනුයෝජිතයන්" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. — *365 වන අධිකාරයේ 20 වන වගන්තිය සංශෝධනය කිරීම.*

**3.** 21 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ප්‍රධාන ප්‍රඥප්තියේ 21අ වන වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය:— — *ප්‍රධාන ප්‍රඥප්තියට 21අ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම.*

*"අනුයෝජිතයා පත්කිරීම සහ අනුයෝජිතයාගේ කාර්ය.*

21අ. (1) සමාගම් ආඥාපනත යටතේ ලියාපදිංචි කරනු ලැබුවා වූ ද, කොටස්වලින් සියයට අනූපහක් ආණ්ඩුව විසින් හා ඉතිරි කොටස් සංස්ථාවකින් හෝ ජාතික ගුවන් සේවාව ක්‍රියාත්මක කරවන මණ්ඩලය නැතහොත් සමාගම විසින් ද දරනු ලබන්නා වූ ද සමාගමක් ආණ්ඩුවේ අනුයෝජිතයකු ලෙස පහත සඳහන් කාර්ය සඳහා අමාත්‍යවරයා විසින්, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයකින් පත් කරනු ලැබිය හැකි ය:—

(අ) ආණ්ඩුව වෙනුවෙන් ගගන යාත්‍රාංගන සංවර්ධනය කිරීම, ගුවන් තොටුපළවල් පවත්වාගෙන යාම සහ පරිපාලනය කිරීම ;

(ආ) ඒ ගුවන් තොටුපළවල සහ ගගන යාත්‍රාංගනවල ගුවන් තොටුපළ සහ ගගන යාත්‍රාංගන පහසුකම් සැලසීම ;

(ඇ) ගුවන් සංතරණ සේවා සහ පහසුකම් සැලසීම සහ පවත්වාගෙන යාම ;

(ඈ) ගගන යාත්‍රාංගනවල ගිනි නිවීමේ පහසුකම් සැලසීම.

(2) අනුයෝජිතයාගේ සංස්ථා පත්‍රයෙහි සහ සාංගමික ව්‍යවස්ථාවලියෙහි කුමක් සඳහන් වුව ද, අනුයෝජිතයා විසින් තම කර්තව්‍ය පලදායී ලෙස ඉටු කරනු ලැබීම පිණිස අනුයෝජිතයාගේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යම් සාමාජිකයකු ධුරයෙන් ඉවත් කිරීම අවශ්‍ය යයි හෝ අවස්ථාවෝචිත යයි අමාත්‍ය වරයාට පෙනී යන අවස්ථාවක, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින්, එම සාමාජිකයා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(3) අමාත්‍යවරයාගේ ලිඛිත අනුමැතිය කලින් ලබාගෙන මිස, ඒ අනුයෝජිතයාගේ සංස්ථා පත්‍රය හෝ සාංගමික ව්‍යවස්ථාවලිය සංශෝධනය නොකළ යුතු ය. ඒ අනුමැතිය නොමැතිව කරනු ලැබුවේ යයි අදහස් කෙරෙන යම් සංශෝධනයක් නීතියෙහි ලා බලයක් හෝ බලපෑමක් නොතිබිය යුතු ය.

(4) අනුයෝජිතයාගේ කර්තව්‍ය ඉටු කිරීම සම්බන්ධයෙන් සාමාන්‍ය හෝ විශේෂ විධාන, අමාත්‍යවරයා විසින් අනුයෝජිතයාට දෙනු ලැබිය හැකි අතර, ඒ විධානවලට අනුකූලව ක්‍රියා කිරීම අනුයෝජිතයාගේ කාර්ය විය යුතු ය.

(5) (අ) ජාතික ආරක්ෂාව උදෙසා ; හෝ

(ආ) වෙනත් යම් රටක් හෝ දේශයක් සමග ජනරජයේ සම්බන්ධකම්වලට බලපාන්නේ යයි අමාත්‍යවරයාට පෙනී යන යම් කරුණක් සම්බන්ධයෙන් ; හෝ

(ඇ) ජනරජය ජාත්‍යන්තර සංවිධානයක සාමාජිකයකු වීමේ හෝ ජාත්‍යන්තර ගිවිසුමකට පාර්ශ්වකරුවකු වීමේ හෝ හේතුවෙන් ජනරජය බැඳෙන වග කීමක් ඉටු කිරීම සඳහා හෝ ඉටු කිරීම පහසු කිරීම සඳහා ; හෝ

(ඈ) ජනරජය, ජාත්‍යන්තර සංවිධානයක සාමාජිකයකු වීම හෝ ජාත්‍යන්තර ගිවිසුමක පාර්ශ්වකරුවකු වීම හෝ හේතුකොට ගෙන වෙනත් යම් අරමුණක් ඉටු කර ගැනීම අමාත්‍යවරයාගේ මතය අනුව, යෝග්‍ය වන්නේ ද, එම අරමුණ ඉටු කර ගැනීම සඳහා හෝ ඉටු කර ගැනීම පහසු කිරීම සඳහා ; හෝ

(ඉ) ජනරජයට, ජාත්‍යන්තර සංවිධානයක සාමාජිකයකු වීමට හෝ ජාත්‍යන්තර ගිවිසුමක පාර්ශ්වකරුවකු වීමට හෝ හැකි වීම සඳහා

(4) වන උපවගන්තියෙන් අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතලවල ව්‍යාප්තියට හානියක් නොවන පරිදි, අනුයෝජිතයාට කිරීමට බලය ඇති යම් විශේෂ දෙයක් කරන ලෙස හෝ යම් විශේෂ දෙයක් කිරීමෙන් වැළකී සිටින ලෙස හෝ විධාන කිරීම යෝග්‍ය යයි ඔහු සලකනහොත් අමාත්‍යවරයා විසින් අනුයෝජිතයාට එසේ විධාන කරනු ලැබිය හැකි ය.

(6) (අ) යම් ගුවන් තොටුපළක් හෝ ගගන යාත්‍රාංගනයක් ප්‍රයෝජනයට ගැනීම විධිමත් කිරීමේ දී ;

(ආ) එවැනි යම් ගුවන් තොටුපළක හෝ යාත්‍රාංගනයක ඇති පහසුකම් ආණ්ඩුවේ යම් දෙපාර්තමේන්තුවක් සඳහා වෙන් කිරීමේ දී

අනුයෝජිතයා විසින් අමාත්‍යවරයා විමසා ක්‍රියා කළ යුතු ය.

(7) යම් ගුවන් යානාවකට යම් අනතුරක් වූ විට දී හෝ යම් සංතරණ උපකරණ සම්බන්ධයෙන් අයුතු මැදිහත් වීමක දී හෝ ඒවාට අලාභ හානි සිදු වීමක දී, අනුයෝජිතයා විසින් ඒ කාරුණු අමාත්‍යවරයා වෙත දන්වා සිටිය යුතු ය.

(8) අනුයෝජිතයාට තම කර්තව්‍ය ඉටුකිරීමට හැකිවීම පිණිස සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂවරයා වෙත සතු වී ඇති චංචල සහ නිශ්චල දේපළ අමාත්‍යවරයා විසින් නිර්ණය කරනු ලබන නියම සහ කොන්දේසි මත අනුයෝජිතයා විසින් පරිහරණය කිරීම සහ පාලනය කිරීම සඳහා අමාත්‍යවරයා විසින් ලබා දිය හැකි ය.

(9) (8) වන උපවගන්තිය යටතේ තමාට ලබා දී ඇති සියලු නිශ්චල දේපළ සහ චංචල දේපළ අනුයෝජිතයා විසින් මනා තත්ත්වයෙන් පවත්වාගෙන යා යුතු අතර, අමාත්‍යවරයාගේ ලිඛිත පූර්ව අනුමැතිය නොලැබ ඒ දේපළක් වෙනස් කිරීම හෝ මාරු කිරීම හෝ ඒ දේපළ විෂයෙහි සම්බන්ධතාවක් බැහැර කිරීම හෝ එහි යම් ධාවන පථ, තල ධාවන පථ, පෙරවැස්ම, ගොඩනැගිලි සහ හැංගර නැතීම හෝ නොකළ යුතු ය.

(10) යුද්ධයක් පවත්නා හෝ අත්‍යාසන්න කාලයක දී හෝ ජාතික හදිසි අවස්ථා කාලයක දී අමාත්‍යවරයා විසින් නියමයක් කිරීමෙන් (8) වන උපවගන්තිය යටතේ අනුයෝජිතයාට ලබාදුන් යම් දේපළක් අමාත්‍යවරයාගේ භාරයට පත් කරන ලෙස නියම කළ හැකි අතර, ඒ නියමය බලාත්මකව පවතින අතරතුර දී, අමාත්‍යවරයා විසින් ඒ දේපළ කළමනාකරණය කිරීම පිළිබඳව, තමා සුදුසු යයි සිතන විධාන අනුයෝජිතයා වෙත දිය හැකි ය ; ඒ විධානවලට අනුකූලව ක්‍රියා කිරීම අනුයෝජිතයාගේ කාර්ය විය යුතු ය.

(11) (1) වන උපවගන්තිය යටතේ වූ නියමයේ දිනයෙහි පවත්නා, ගුවන් සංතරණයට අදාළ ආණ්ඩුවේ සියලු ගිවිසුම්, බැඳීම් හා වගකීම් අතුරින් අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයකින් ප්‍රකාශ කරනු ලබන ගිවිසුම්, බැඳීම් හා වගකීම් දෙවනුව සඳහන් කරන ලද නියමයේ දිනයේ සිට, අනුයෝජිතයාගේ ගිවිසුම්, බැඳීම් හා වගකීම් ලෙස සලකනු ලැබිය යුතු ය.

(12) අනුයෝජිතයා එලෙස පත් කරන නියමයේ දිනයට පසුව අනුයෝජිතයා ඇති කර ගත් සෑම ගිවිසුමක් ම ඒ ගිවිසුමේ නියමවල, පටහැණි ප්‍රකාශිත විධිවිධාන සලසා ඇත් නම් මිස, අනුයෝජිතයා විසින් රජය වෙනුවෙන් නොව තමා වෙනුවෙන් ම ඇති කර ගත් ගිවිසුමක් ලෙස සලකනු ලැබිය යුතු අතර, රජය ඉන් නොබැඳුනේ යයි සැලකිය යුතු ය.

(13) අනුයෝජිතයා විසින් තම කාර්තව්‍ය ඉටු කිරීමේ දී හෝ ඉටු කිරීමේ අදහසින් කරන ලද හෝ නොකර හරින ලද හෝ යම් දෙයක් සම්බන්ධයෙන් රජයට විරුද්ධව කිසිම නඩු කටයුත්තක් නොපවරනු ලැබිය යුතු ය.

(14) 1971 අංක 38 දරන මුදල් පනතේ 12 වන, 13 වන, 14 වන සහ 15 වන වගන්ති, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අනුයෝජිතයාගේ ප්‍රාග්ධන වියදම් සඳහා පාර්ලිමේන්තුව විසින් ප්‍රතිපාදනය කරනු ලබන මුදල් ප්‍රමාණයක් හා සම්බන්ධ ගිණුම් විගණනය කිරීමට අදාළ විය යුතු ය.

(15) අමාත්‍යවරයා විසින් ලිඛිත දැන්වීමක් කිරීමෙන් අනුයෝජිතයාගේ මුදල් තත්ත්වය පිළිබඳව ඒ දැන්වීමෙහි සඳහන් තොරතුරු තමා වෙත සපයන ලෙස අනුයෝජිතයාට නියම කරනු ලැබිය හැකි අතර, ඒ දැන්වීමේ නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීම අනුයෝජිතයාගේ කාර්යය විය යුතු ය. තව ද, අනුයෝජිතයා විසින් එක් එක් ලිත් වර්ෂය අවසානයේ දී—

(අ) එම වර්ෂය තුළ දී අනුයෝජිතයාගේ කට යුතු පිළිබඳ වාර්තාවක් ; හා

(ආ) එම වර්ෂය සඳහා අනුයෝජිතයාගේ අයවැය ලේඛනයේ, ශේෂ පත්‍රයේ හා ලාභාලාභ ගිණුම් පත්‍රයේ පිටපතක්

අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(16) (1) වන උපවගන්තිය යටතේ අනුයෝජිතයකු පත් කිරීමේ හේතුවෙන් (ආණ්ඩුවේ ඒකාබද්ධ සේවයේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ස්ථාන මාරු කිරීමට යටත් එම සේවයේ නිලධරයකු නොවන) යම් රජයේ නිලධරයකුගේ සේවය සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුවට තවදුරටත් අවශ්‍ය නොවන බවට උචිත බලධරයා සෑහීමට පත්වන අවස්ථාවක, ඔහු විසින් ඒ නිලධරයා දැරූ ධුරය අහෝසි කරනු ලැබිය හැකි ය :

එසේ වුව ද ආණ්ඩුවේ ඒකාබද්ධ සේවයේ නිලධරයකු වන හා ඒකාබද්ධ සේවය පිහිටුවීමට කලින් දිනයක සිට සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුවේ අඛණ්ඩව සේවය කර ඇති යම් රජයේ නිලධරයකු විසින් දරන ලද ධුරය, අනුයෝජිතයා පත් කිරීමේ හේතුවෙන් ඒ නිලධරයාගේ සේවය ඒ දෙපාර්තමේන්තුවට තවදුරටත් අවශ්‍ය නොවන බවට උචිත බලධරයා සෑහීමට පත් වන අවස්ථාවක ඔහු විසින් අහෝසි කරනු ලැබිය හැකි ය.

(17) (16) වන උපවගන්තිය යටතේ ධුරය අහෝසි කරන ලද රජයේ නිලධරයකුගේ ධුරය විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත යයි ප්‍රකාශ කරනු ලැබ ඇති අවස්ථාවක, ධුරය අහෝසි කිරීමේ හේතුව මත, ඔහු රජයේ සේවයෙන් විශ්‍රාම ගත්තේ නම් විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ඔහුට ගෙවිය හැකිව තිබූ විශ්‍රාම වැටුප හෝ පාරිතෝෂිකය හෝ ගෙවනු ලැබීම පිණිස ඔහු සුදුස්සකු විය යුතු ය.

(18) (16) වන උපවගන්තිය යටතේ තම ධුරය අහෝසි කරනු ලැබූ යම් රජයේ නිලධරයකු නිශ්චිත කාලසීමාවක් ආණ්ඩුවට සේවය කිරීමට බැඳුම්කරයකට හෝ ගිවිසුමකට යටත්ව සිටින අවස්ථාවක, අනුයෝජිතයාගේ කාර්ය මණ්ඩලයේ ඔහු විසින් සේවය කරනු ලබන යම් කාලයක්, ඒ බැඳුම්කරය හෝ ගිවිසුම සම්පූර්ණ කිරීමේ කාර්ය සඳහා ආණ්ඩුවට සේවය කරන ලද කාලයක් ලෙස සලකනු ලැබිය යුතු ය :

එසේ වුව ද, එවැනි යම් නිලධරයකුට අනු යෝජිතයාගේ කාර්ය මණ්ඩලයේ රැකියාව දෙනු ලැබ ඔහු එය භාර නොගත්තේ නම්, ඔහු, ඒ බැඳුම් කරයේ හෝ ගිවිසුමේ හෝ නියම හා කොන්දේසි වලට යටත්ව, ඒ බැඳුම්කරයේ හෝ ගිවිසුම යටතේ සම්පූර්ණ නොකරන ලද යම් සේවා කාලයක් සම්බන්ධයෙන්, ඒ බැඳුම්කරයේ හෝ ගිවිසුමේ නියම අනුව ගණන් බලන ලද මුදල් ප්‍රමාණයක් ආණ්ඩුවට ගෙවීමට යටත් වන්නේ ය.

(19) (අ) අනුයෝජිතයාගේ ඉල්ලීම පිට, (16) වන හා (17) වන උපවගන්ති අදාළ වන රජයේ නිලධරයකු නොවන යම් රජයේ නිලධරයකු, ඒ නිලධරයාගේ හා තත්කාලයේ සිවිල් ගුවන් සේවා විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ හා රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ කැමැත්ත ඇතිව, එවැනිම කැමැත්ත ඇතිව අනු යෝජිතයා විසින් තීරණය කරනු ලැබිය හැකි කාල යක් සඳහා අනුයෝජිතයාගේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය. නැතහොත් එවැනිම කැමැත්ත ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(ආ) රජයේ නිලධරයකු අනුයෝජිතයාගේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලබන අවස්ථාවක, 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනතේ 13 වන වගන්තියේ (2) වන උප වගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඒ නිලධරයාට හා ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(ඇ) රජයේ නිලධරයකු අනුයෝජිතයාගේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලබන අවස් ථාවක 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනතේ 13 වන වගන්තියේ (3) වන උප වගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට හා ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(20) ගුවන් තොටුපළවල් හෝ යම් ගුවන් සංතරණ සේවා හෝ පහසුකම් දියුණු කිරීම සඳහා අනුයෝජිතයා විසින් ආනයනය කරනු ලබන යම් ප්‍රාග්ධන උපකරණ සඳහා යම් රේගු බදු ගෙවීමෙන් අනුයෝජිතයා නිදහස් වන්නේ ය.".

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තියෙහි "මේ පනතේ" යන වචන වෙනුවට "තම කර්තව්‍ය ඉටු කිරීමේ දී අනුයෝජිතයා විසින් දරන ලද වියදම් හැර, මේ පනතේ" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"ගාස්තු ආදිය ඒකාබද්ධ අරමුදලට ගෙවිය යුතු බව.

23. (1) ගාස්තු අය කිරීම් හෝ දඩ වශයෙන් මේ පනත යටතේ ගෙවනු ලබන හෝ අය කර ගනු ලබන සියලු මුදල් (3) වන උපවගන්තියට යටත් ව ඒකාබද්ධ අරමුදලට ගෙවනු ලැබිය යුතු ය.

(2) අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් නිශ්චය කරනු ලබන මේ පනත යටතේ පනවනු ලබන හෝ අය කර ගනු ලබන ගාස්තු, කුලී, බදු හෝ වෙනත් අය කිරීම් අනුයෝජිතයා විසින් ආණ්ඩුව වෙනුවෙන් එකතු කර ගැනීම හෝ අය කර ගැනීම කරනු ලැබිය යුතු ය.

(3) අනුයෝජිතයා විසින් ආණ්ඩුව වෙනුවෙන් එකතු කර ගන්නා ලද හෝ අය කර ගන්නා ලද ගාස්තු, බදු හෝ අයකිරීම්වලින් අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් නිශ්චය කරනු ලබන කොටසක් අනුයෝජිතයා විසින් තම කර්තව්‍ය ඉටු කිරීමෙහි ලා තමා විසින් සලසන ලද සේවාවන් සඳහා ගාස්තු වශයෙන් තබා ගත යුතු අතර, ඉතිරි මුදල ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු ය.".

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තිය සංශෝධනය කිරීම.

(i) "ගගන යාත්‍රාංගනය" යන්නෙහි අර්ථ කථනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථ කථනය ඇතුළත් කිරීමෙන් :—

'"අනුයෝජිතයා" යන්නෙන් 21අ වන වගන්තිය යටතේ පත් කරනු ලබන අනුයෝජිතයකු අදහස් වේ ;';

(ii) "ගුවන් යානය" යන්නෙහි අර්ථ කථනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථ කථන ඇතුළත් කිරීමෙන් :—

'"ගුවන් සංතරණ සේවා" යන්නෙන් සංතරණ ආධාරක සහ සංතරණ පහසුකම් අදහස් වේ ;

"ගුවන් තොටුපළ" යන්නෙන් ගගන යාත්‍රා සඳහා ආවරණය, සේවා කිරීම් සහ අලුත් වැඩියා කිරීම් ද මගින් හෝ ගුවන් නැව් බඩු පිළිගැනීම හෝ පිට කිරීම සඳහා පහසුකම් සලසනු ලබන ගගන යාත්‍රාංගනයක් අදහස් වන අතර හෙලිකොප්ටර් තොටුපළක් ද ඊට ඇතුළත් වේ;

"ගුවන් ගමනාගමන පාලනය" යන්නෙන්—

(අ) (i) ගුවන් යානා එකිනෙක අතර, සහ

(ii) ගුවන් යානා සහ බාධක අතර හැසිරවීමේ ප්‍රදේශයන්හි දී

ගැටුම් වැළැක්වීමේ කාර්යය සඳහා ; සහ

(ආ) ගුවන් යානා ගමනාගමන ඉක්මන් කිරීම හා ක්‍රමවත් ගුවන් යානා ගමනාගමන ධාරාවක් පවත්වාගෙන යාම සඳහා

සලසනු ලබන සේවාව අදහස් වේ;';

(iii) "බලපත්‍රලත් ගගන යාත්‍රාංගනය" යන්නෙහි අර්ථ කථනය ට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථ කථන ඇතුළත් කිරීමෙන් :—

'"ජාතික ගුවන් සේවය" යන්නෙන් ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රවාහකයා ලෙස තත් කාලයෙහි නම් කරනු ලැබූ ගුවන් සේවය අදහස් වේ;

"සංතරණ ආධාරක" යන්නෙන් ගුවන් මාර්ගයක ඇති දෘෂ්‍ය හා දෘෂ්‍ය නොවන සංතරණ ආධාරකයන් ද ලඟා වීම සහ ගොඩබෑස්සවීම සඳහා ගගන යාත්‍රාංගනයක ඇති දෘෂ්‍ය සහ දෘෂ්‍ය නොවන ආධාරකයන් ද අදහස් වන අතර, සංනිවේදන සේවා, කාලගුණ විද්‍යාත්මක සේවා සහ ගුවන් ගමනාගමන පාලන සේවා ද අදහස් වේ;

"සංතරණ පහසුකම්" යන්නෙන් ගුවන් යානා ආරක්ෂා සහිතව සංතරණය කරවීම සඳහා සලසා ඇති පහසුකම් අදහස් වන අතර දෘෂ්‍ය සහ දෘෂ්‍ය නොවන සංතරණ ආධාරකයන් ද ඊට ඇතුළත් වේ.'.

## II වන කොටස

1979 අංක 46 දරන පනත ඉවත් කිරීම.

7. 1979 අංක 46 දරන ගුවන් තොටුපළවල් පිළිබඳ අධිකාරිය පනත මෙයින් ඉවත් කරනු ලැබේ.

මේ වගන්තියෙහි සහ 8 වන වගන්තියෙහි "ගුවන් තොටුපළවල් පිළිබඳ අධිකාරිය" යන්නෙන් 1979 අංක 46 දරන ගුවන් තොටුපළවල් පිළිබඳ අධිකාරිය පනත මගින් පිහිටුවනු ලැබූ ගුවන් තොටුපළවල් පිළිබඳ අධිකාරිය අදහස් වේ.

සංක්‍රාන්ති විධිවිධාන.

8. (අ) නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ගුවන් තොටුපළවල් පිළිබඳ අධිකාරිය සන්තකයේ සහ පාලනයේ තිබුණු සියලු නිශ්චල සහ චංචල දේපළ සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂවරයා වෙත පැවරෙන්නේ ය; සතු වන්නේ ය;

(ආ) නියමිත දිනයට පෙර ගුවන් තොටුපළවල් පිළිබඳ අධිකාරිය විසින් දරන ලද සියලු ණය, බැඳීම් හා වගකීම් ද, ලියා අත්සන් කරන ලද හෝ ඇති කර ගන්නා ලද සියලු ගිවිසුම්, ඔප්පු, එකඟවීම් හා වෙනත් සාධන පත්‍ර ද ඒ අධිකාරිය විසින් හෝ සමග කිරීමට ගිවිස ගත් සියලු කරුණු සහ දේවල් ද නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයෙහි පැවතුනේ ද ඒවා ගුවන් සංතරණ පනතේ 21අ වන වගන්තිය යටතේ පත් කරන ලද අනුයෝජිතයා විසින් දරන ලද, ලියා අත් සන් කරන ලද, ඇති කර ගන්නා ලද නැතහොත් අවස්ථාවෝචිත පරිදි, අනුයෝජිතයා විසින් හෝ ඔහු සමග කිරීමට ගිවිසගත් ලෙස සලකනු ලැබිය යුතු ය;

(ඇ) ගුවන් තොටුපළවල් පිළිබඳ අධිකාරිය විසින් හෝ එයට විරුද්ධව හෝ පවරනු ලැබ නියමිත දිනයට පෙරාතුව ම වූ දිනය වන විට අසා නිම නොවී තිබුණු සියලු නඩු සහ වෙනත් නඩු කටයුතු ගුවන් සංතරණ පනතේ 21අ වන වගන්තිය යටතේ පත් කරනු ලැබූ අනුයෝජිතයා විසින් හෝ ඔහුට විරුද්ධව හෝ පවරනු ලැබූ නඩු සහ නඩු කටයුතු ලෙස සලකනු ලැබිය යුතු ය; තව ද ඒ අනුව ඒ සෑම නඩුවක් සහ නඩු කටයුත්තක් ම ඉදිරියට ගෙන යාම සහ ක්‍රියාත්මක කිරීම කළ හැකි ය;

(ඈ) නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයෙහි ගුවන් තොටුපළවල් පිළිබඳ අධිකාරියෙහි සේවයෙහි නියුක්තව සිටි සියලු නිලධරයන් සහ වෙනත් සේවා නියුක්තයන් ගුවන් තොටුපළවල් පිළිබඳ අධිකාරියෙහි සේවා නියුක්තයන් වීම අවසන් විය යුතු අතර, ගුවන් සංතරණ පනතේ 21අ වන වගන්තිය යටතේ පත් කරනු ලැබූ අනුයෝජිතයා යටතේ සේවා නියුක්තිය ඔවුනට නොදෙනු ලැබුවහොත්, අමාත්‍යවරයා විසින් සේවා නියුක්තයන්ගේ පූර්ව සේවය මෙන්ම වන්දි මුදල් සහ පාරිතෝෂික මුදල් තීරණය කිරීමට අදාළ වෙනත් කරුණු ද සලකා තීරණය කරනු ලබන වන්දි මුදල සහ පාරිතෝෂික මුදල ලැබීමට ඔවුන්ට සුදුසුකම් ලැබෙන්නේ ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබා ගත හැකිය.